# මධ්‍යම පළාත් ළමා නාට්‍ය උළෙල - 2024

ළමා ලෝකය කේන්ද්‍රකර ගැනුණු විවිධ ප්‍රස්තුත ඇසුරෙන් ඔවුනගේ ජීවන අත්දැකීම්වල සාධනීය සහ නිශේධනීය තත්ත්වයන් කෙරෙහි සමාජ අවධානය යොමු කරවීමටත් වැඩිහිටියන්ගේ චින්තන රටාවෙහි ළමයින් අරමුණු කරගත් සුබවාදී චෛතසිකයන් නිර්මාණය කර ගැනීමත්, දරුවන්ගේ කුසලතා එළිදැක්වීමට අවස්ථාව ලබාදීමත්, මනා පෞරුෂත්වයක් ඇති දරු පරපුරක් බිහි කිරීමත් අරමුණු කර ගනිමින් මධ්‍යම පළාත් ළමා නාට්‍ය තරගාවලියක් පැවැත්වීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව තීරණය කර තිබේ.

**මෙහි ද්විතීයික අරමුණු ලෙස**

* මනා පරිකල්පන ශක්තියකින් හෙබි නිර්මාණාත්මක දරු පරපුරක් බිහි කිරීම.
* දරුවනට සහජයෙන් උරුම වූ කුසලතාවන් වර්ධනය කර ගැනීමටත් ඒ තුළින් සමාජය පිළිබඳව පරිණත අවබෝධයක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම.
* කලාව උපයෝගි කර ගනිමින් සමාජයට යහපත් පණිවිඩයක් ලබා දීම.
* දරුවනට ඔවුනගේ ළමා ලෝකය අනුව සිතීමට ක්‍රියා කිරීමට අවස්ථාව ලබා දීම.
* ළමයින්ගේ රසවින්දන හැකියාව වැඩිදියුණු කිරීමට අවස්ථාව ලබාදීම.

**පවත්වන ක්‍රමවේදය**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු සංස්කෘතික නිලධාරීන් මාර්ගයෙන් ප්‍රචාරණ කටයුතු කර අයදුම්පත් කැඳවීම් මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. (**www.culture.cp.gov.lk**)
- අයදුම්පත්‍ර යොමු කළ ළමා නාට්‍ය අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
- නාට්‍ය අත්පිටපත් රචනයට අවස්ථාව ලබාදීම සහ අත්පිටපත් සාරාංශ පිටපත් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීම.
- අත්පිටපත් ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් වෙත යොමු කිරීම තුළින් නාට්‍ය නිෂ්පාදනය සඳහා සුදුසු නිර්මාණ තෝරා ගැනීම.
- ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් සහභාගි කර ගනිමින් ජයග්‍රාහී නාට්‍ය තෝරා ගැනීම.
- මධ්‍යම පළාත් කෙටි නාට්‍ය සහ කෙටි චිත්‍රපට උළෙලේ දී ජයග්‍රහණය කරන නිර්මාණ ඇගයීමට ලක් කිරීම.

**තරඟ කොන්දේසි**

1. ළමා නාට්‍ය තරගය සඳහා ඉදිරිපත් වන නාට්‍ය අධ්‍යක්ෂවරුන් මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර නාට්‍ය අත්පිටපත් යොමු කිරීමේදී ළමයින්ට උචිත තේමාවක් තෝරා ගත යුතුය.
2. මෙම තරඟය ළමා පරපුර ඉලක්ක කරගත් වැඩසටහනක් බැවින් රංගනය සඳහා ළමයින් පමණක් සම්බන්ධ කර ගත යුතු අතර සංගීතය, වෙස් ගැන්වීම්, පසුතල වේදිකා සැරසිලි, රංග වස්ත්‍ර නිර්මාණය සහ වෙනත් සැලසුම් කටයුතු සඳහා දරුවනට හැකියාව නැති නම් වැඩිහිටි අයගේ සහාය ලබා ගැනීමට ඉඩකඩ ඇත.
3. මෙම තරගය විවෘත අංශයෙන් පමණක් පැවත්වේ. නමුත් පාසැල්, දහම් පාසැල් සහ ළමා සමාජවල දරුදැරියන්ට මෙම තරගය සඳහා සහභාගි විය හැකිය. පාසල් දරුවන් සහභාගි කර ගන්නේ නම් අදාළ පාසලෙහි විදුහල්පති දැනුවත් කොට විදුහල්පතිවරයාගේ නිර්දේශය ඇතුළත්ව අයදුම්පත් යොමු කළ යුතුය.
4. ඉදිරිපත් වන ළමයින්ගේ උපරිම වයස් සීමාව අවු.18 වේ. නාට්‍යයට සම්බන්ධ සියලු ශිල්පීන්ගේ නම , ලිපිනය සහ අත්සන් සමඟ ඇමුණුමක් පහත ආකෘතියට අනුව නාට්‍ය තරගයට පෙර ඉදිරිපත් කල යුතුය.

| අනු අංකය | රංගන ශිල්පියාගේ /ශිල්පිනියගේ නම | චරිතයයේ නම /ශිල්පියකුනම් ශිල්පීය තත්ත්වය | ලිපිනය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |

5. ළමා නාට්‍යයක් සඳහා උපරිම කාලය විනාඩි 15 ත් 25 ත් අතර විය යුතුය. එසේම උපරිම කාලය ඉක්මවා කටයුතු නොකිරීමට වග බලා ගත යුතුය. උපරිම කාලසීමාව ඉක්මවා නොයාමට වගබලා ගත යුතුය.
6. ඉදිරිපත් කරන නාට්‍ය ස්වතන්ත්‍ර, පරිවර්තන, අනුවර්තන හෝ වෙනත් ඕනෑම ආකෘතියකට ඉදිරිපත් කළ හැකි නමුත් පාසල් විෂය නිර්දේශයන්හි නිර්දිෂ්ට ග්‍රන්ථ හෝ නිර්දිෂ්ට නාට්‍ය වලින් උපුටාගත් කොටස් ඉදිරිපත් නොකිරීමට වගබලා ගත යුතුය.
7. නාට්‍ය සඳහා ඉදිරිපත් වන කණ්ඩායම සියලුම ශිල්පීන් ඇතුළුව 25 ක උපරිමයකට යටත් විය යුතුය.
8. අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ වෙනත් රාජ්‍ය ආයතනයකින් පවත්වන ලද නාට්‍ය තරඟයකට ඉදිරිපත් කර ජයග්‍රහණය කර සම්මාන ලබා ඇති නාට්‍යයන් මෙම තරඟයට ඉදිරිපත් කළ නොහැකි අතර ඒ බව යම් හෙයකින් නාට්‍ය තරඟයට පෙර සනාථ වුවහොත් නාට්‍ය තරඟයෙන් ඉවත් කිරීමට සිදුවනු ඇත. එසේ වුවද වෙනයම් තරගයකට ඉදිරිපත් කර ජයග්‍රහණය නොකළ නාට්‍ය මේ සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇත.
9. නාට්‍ය අත් පිටපත ළමා ක්‍රියාකාරකම් සහිතව ළමා මනසට යෝග්‍ය වූ ඔවුන්ගේ ජීවිතය පිළිබිඹු වන කතාවක් විය යුතු අතර ළමා නාට්‍ය සඳහා යොදා ගන්නා භාෂාවද පොදු ළමා ප්‍රේක්ෂකාගාරයකට ගැලපෙන සේ යොදා ගැනීම අනිවාර්ය වේ. එසේ නොමැති නාට්‍ය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
10. ඉදිරිපත් කරන නාට්‍ය තුළ අසභ්‍ය රංගනයන් සහ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ රංගන ඇතුළත් නොවිය යුතුය.
11. ළමා නාට්‍ය තරඟය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට බලාපොරොත්තු වන අතර වැඩමුළුවෙන් පසුව පිටපත් රචනය ලබා දීමට අවස්ථාව සලසා ඇත.
12. නාට්‍ය තරගයට අයදුම්පත්‍ර 2024.05.25 පෙර එවිය යුතුය.
13. පුහුණු වැඩමුළුව 2024 ජුනි මස 15 දිනට පෙර පැවැත්වීමට අදහස් කරන අතර නාට්‍ය අත්පිටපත පිටපත් 04 කින් තනි පැත්තේ පරිගණක ගත කර හෝ පැහැදිලි අත් අකුරින් ලියා 2024/06/30 වන දිනට පෙර ලබා ගැනීමට බලාපොරොත්තු වේ. ඒ සමග
    * නාට්‍ය සාරාංශය,
    * නාට්‍ය දෘෂ්ටිය සහ
    * චරිත විග්‍රහය ද ඇතුළත් විය යුතුය.
14. අත් පිටපත් යොමු කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **මධ්‍යම පළාත් ළමා නාට්‍ය උළෙල-2024** යන්න සඳහන් කර **සංස්කෘතික දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දිය හැකිය.නැතහොත් තමන්ට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී වෙත ගෙනවිත් හෝ තැපෑලෙන් භාර දිය හැකිය. එසේම අත් පිටපත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන නාට්‍ය අත් පිටපත් භාර ගනු නොලැබේ.

**පොදු කොන්දේසි**

i. ඉදිරිපත් කරන නාට්‍ය පිටපතෙහි නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ නම සඳහන් නොකළ යුතු අතර අයදුම්පත්‍රයෙහි සියලු විස්තර සඳහන් කළ යුතුය.
ii. තෝරා ගන්නා ලද නාට්‍ය අත් පිටපත් සඳහා නාට්‍ය නිෂ්පාදනයට අවස්ථාව ලබා දීමෙන් පසු නිෂ්පාදනය කෙරෙන නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් සහභාගි කර ගැනීමෙන් චක්‍රලේඛයේ සඳහන් පරිදි ජයග්‍රාහී නාට්‍ය තෝරා ගැනේ.
iii. අවසන් නාට්‍ය තරඟයේදී විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙන විනිශ්චය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා අනුමත කිරීමෙන් පසු එය අවසාන තීරණය ලෙස පිළිගැනේ.
iv. නාට්‍ය තරඟාවලියෙන් ජයග්‍රාහී නාට්‍ය පමණක් කෙටි නාට්‍ය සහ කෙටි චිත්‍රපටි උළෙලේදී වේදිකාගත කිරීමට සහ චක්‍රලේඛනයේ සඳහන් පරිදි ත්‍යාග සහ සහතික පත්‍ර සහ සම්මාන පිරිනැමීමටත් අපේක්ෂා

කෙරේ. ඒ අනුව නාට්‍ය උළෙලට බාධාවක් නොවන පරිදි ජයග්‍රහණය කරන නාට්‍ය වේදිකාගත කිරීම නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ.

v. යම්කිසි සම්මානයක් පිරිනැමීමට නුසුදුසු බව විනිශ්චය මණ්ඩලය නිර්දේශ කරනු ලබන්නේ නම් එකී සම්මාන ප්‍රදානය නොකිරීමට පළාත් අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කරනු ඇත.

vi. ළමා නාට්‍ය උළෙල සඳහා තෝරා ගන්නා යම් නිර්මාණයක් සම්බන්ධව වෙනත් කවරෙකු හෝ විරෝධයක් පාන්නේ නම් එකී නාට්‍ය ජයග්‍රහණය එළිදැක්වීමට අවම වශයෙන් සති දෙකකට පෙරවත් තම අයිතිවාසිකම් හෝ විරෝධය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් පසුව කෙරෙන විරෝධතා සලකා බලනු නොලැබේ.

vii. තරඟය පැවැත්වීමේ තීරණාත්මක අයිතිය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා සතු වේ.

viii. හොඳම නාට්‍ය අත් පිටපත් අතරට නොතේරුණු නාට්‍ය අත්පිටපත් නාට්‍ය පිටපත යොමු කළ අධ්‍යක්ෂවරයාට අවශ්‍ය නම් පළාත් සංස්කෘතික දෙපාර්මේන්තුවෙන් නැවත ලබා ගැනීමට අවස්ථාව ඇත.

ix. මෙම ව්‍යවස්ථාව කාලීනව සංශෝධනය කිරීමේ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

**ළමා නාට්‍ය තරගයේ සම්මාන සහ සහතික පත්‍ර ප්‍රදානය පහත පරිදි වේ**

| | | | |
|---|---|---|---|
| 1. | වසරේ හොඳම ළමා නාට්‍ය ප්‍රථම ස්ථානය | - | රු. 15 000.00 |
| 2. | වසරේ හොඳම ළමා නාට්‍ය දෙවන ස්ථානය | - | රු. 12 000.00 |
| 3. | වසරේ හොඳම ළමා නාට්‍ය තෙවන ස්ථානය | - | රු. 10 000.00 |

**කුසලතා ජයග්‍රහණ**

| | | | |
|---|---|---|---|
| 4. | හතරවන ස්ථානය | - | රු. 7 500.00 |
| 5. | පස්වන ස්ථානය | - | රු. 7 500.00 |

**විශේෂ කුසලතා**

| | | | |
|---|---|---|---|
| 6. | වසරේ දක්ෂතම ළමා නළුවා | - | රු. 5000.00 |
| 7. | වසරේ දක්ෂතම ළමා නිළිය | - | රු. 5000.00 |
| 8. | වසරේ හොඳම සංගීත නිර්මාණය | - | රු. 5000.00 |
| 9. | වසරේ හොඳම වේදිකා පසුතල නිර්මාණය | - | රු. 5000.00 |
| 10. | වසරේ හොඳම අධ්‍යක්ෂණය | - | රු. 5000.00 |
| 11. | වසරේ හොඳම රංගවස්ත්‍ර නිර්මාණය | - | රු. 5000.00 |
| 12. | වසරේ හොඳම නාට්‍ය රචනය | - | රු. 5000.00 |

ටී එම් ඉනෝදනී තඹවිට
පළාත් අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් සංස්කෘතික
කටයුතු දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත.

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ළමා නාට්‍ය උළෙල - 2024 අයදුම් පත්‍රය

01. ළමා නාට්‍යයේ නම:- ....................................................................................................................

02. අධ්‍යක්ෂකගේ නම :- ....................................................................................................................

03. හැඳුනුම්පත් අංකය :- ....................................................................................................................

04. ලිපිනය :- ....................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

05. ඊ මේල් ලිපිනය :- ....................................................................................................................

06. දුරකථන අංක :- ....................................................................................................................

ජංගම :- ....................................................................................................................

ස්ථාවර :-....................................................................................................................

07. රචකයාගේ නම :- ....................................................................................................................

08. දුරකථන අංක

ජංගම :- ....................................................................................................................

ස්ථාවර :- ....................................................................................................................

09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ....................................................................................................................

10. පාසලේ, දහම් පාසලේ, ළමා සමාජයේ නම සහ ලිපිනය :-

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර මාගේ නාට්‍ය මෙම නාට්‍ය උළෙලට තෝරා ගනු ලැබුවහොත් උළෙලට අවශය වන පරිදි ප්‍රදර්ශනය කිරීමටත් පොරොන්දු වෙමි.

තවද මා විසින් මෙහි ප්‍රකාශිත තොරතුරු අසත්‍ය යයි ඔප්පු වුවහොත් හෝ ව්‍යවස්ථාවේ සඳහන් කරුණු මා විසින් උල්ලංඝනය කරනු ලැබුවහොත් මධ්‍යම පළාත් කෙටි නාට්‍ය උළෙලේ කුමන අවස්ථාවක දී වුවද මාගේ නිර්මාණය තරඟයෙන් ඉවත් කිරීමට හෝ සම්මාන සඳහා නොසලකා හැරීමට මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට අයිතිය ඇති බවත් මෙයින් පිළිගනිමි.

.................................... ............................................

දිනය අත්සන

------------------------------------------------------------------------------------------------------------------------

**<u>පාසැල්, දහම් පාසැල්, ළමා සමාජ අයදුම්කරුවන් සඳහා</u>**

ඉහත අයදුම් පත්‍රයේ සඳහන් ....................................................................................................................

මයා/ මිය/ මෙනවිය/ ශිෂ්‍යයාව /ශිෂ්‍යයා/ මෙම පාසලේ / දහම් පාසලේ / ළමා සමාජයේ නාට්‍ය අංශයේ ක්‍රියාකාරී සමාජිකයකු /සාමාජිකාවක බවත් සහතික කරමි.

............................... ....................................

දිනය අත්සන සහ නිල මුද්‍රාව

ප්‍රාදේශීය ලේකම් විදුහල්පති/දහම් පාසැල් ප්‍රධානාචාර්ය

------------------------------------------------------------------------------------------------------------------------

පළාත් අධ්‍යක්ෂ,

ඉහත තොරතුරු සත්‍ය බවත්, මෙම අයදුම්කරු..................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ..................................................ග්‍රාම නිලධාරී වසම තුළ ස්ථිර පදිංචි අයෙකු බවත් සහතික කරමි.

............................................

අත්සන සහ සංස්කෘතික නිලධාරී නිල මුද්‍රාව